
ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

# බෞද්ධෝදය

"ධම්මො හවේ රකඛති ධමමචාරි"



70 වර්ෂය - ශ්‍රී බු,ව 2559 | 2015 නොවැම්බර් 25 | ඉල් කලාපය

## රත්මලාන ශ්‍රී ධර්මාරාම පුරාණ විහාරවාසි රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍ය කොටනෙළුමේ පුඤ්ඤානන්ද හිමිපාණෝ

# බුදුරජාණන් වහන්සේටත් විපාක දුන් කර්ම විපාක (දෙවැනි කොටස 06-12) (පුබ්බකම්මපිලෝතික සූත්‍රය)

### "කරන කලට පව් මිරිය මිසේ-විඳින කලට දුක් දැඩිවෙයි ගිනි සේ"

(බුදුරජාණන් වහන්සේට විපාක දුන් කර්ම 12 ක් අතුරින් කරුණු 06 ක් පිළිබඳ විස්තර පසුගිය කලාපයෙන් සාකච්ඡා කරන ලදී. ඉතිරි කර්ම විපාක 06 පිළිබඳ මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ.)

### 07. ශරීරය තුවාල වී ලේ කැටි ගැසීම.

දේවදත්ත තෙරුන් වහන්සේ පෙරලූ ගලේ පතුරක් වැදීම නිසා ශ්‍රීපාදයේ මාපට ඇඟිල්ල තැලී ලේ කැටි ගැසිණි. ජීවක වෙද මහතා එම ඇඟිල්ල පලා ලේ ඉවත් කොට සුවපත් කළේය. ජීවක වෙද මහතා ඇඟිල්ල පලා කුණු ලේ ඉවත් කොට බෙහෙත් දැමීම සඳහා සවස නැවත පැමිණීමේ බලාපොරොත්තුවෙන් ඇතුල් නගරයට ගියේය. එහෙත් එදා නැවත පැමිණීමට නොහැකි විය. මේ නිසා එදා රෑ පහන් වෙනතුරු බුදුරජාණන් වහන්සේට වේදනාව විඳිමින් සිටීමට සිදු වූ සේක. ඇඟිල්ලක් පලා ලේ ඉවත් කිරීමේ දී කොතරම් වේදනාවක් විඳීමට සිදුවනවා ද යන්න ඔබට වැටහෙනවා ඇත.

මෙසේ සිදුවීමට හේතුව මෙසේය. පෙර ආත්ම භාවයක දී අප බෝධි සත්ත්වයන් වහන්සේ රජෙක් වී උපත ලබා සිටියේය. එම ආත්ම භාවයේ දී කාමරාගය නිසා එක් පුද්ගලයෙක් කඩුවකින් කපා මරා දැමීය.

නිරපාදේ මිනිස් ජීවිතයක් තොර කිරීමේ විපාක ලෙස ආත්ම ගණනක් නිරයේ දුක්වින්දේය. නොයෙක් ආත්මවල ඉපදී විපාක වින්දේය. බුදුවන ආත්ම භාවයේදීත් මෙසේ ශෛලකර්මයකට භාජනය වීමට සිදු විය.

## 08. නිතර නිතර හිසේ රුදාවක් ඇතිවීම.

බුදුරජාණන් වහන්සේට නිතර නිතර හටගත් හිසේ රුදාවක් විය. ධර්ම දේශනා කරන සමහර අවස්ථා වල සැරියුත් හිමියන්ට ඉතිරි දේශනාව පවත්වන්නට භාර දී උන්වහන්සේ විවේක ගත් අවස්ථා අපට දැකගත හැකි වෙයි.

බෝධිසත්වයන් වහන්සේ පෙර ආත්ම භාවයක දී කෙවුල් ගමක (මාළු අල්ලන මිනිසුන් සිටින) දරුවෙක් වී ඉපදී සිටියේය. තමාගේ නෑයන් මාළු අල්ලන තැනට ගොස් ගොඩක් මාළු හසුවී සිටිනු දැක තව හසුවනවා නම් කොච්චර හොඳ ද කියා සිතීය. මිය යෑමට දඟලන මාළු දැක සතුටු වීමේ විපාකය නිසා හිසේ රුජාවක් ඇති විය.එසේම එදා මාළු ඇල්ලූ තමාගේ නෑයන් ද බුදුවන ආත්මයේදී නෑයන් වී ඉපදීමත් විශේෂත්වයකි. එදා සියලුදෙනා එකතු වී මාළු මැරූ පාපය නිසා විඩූඩභ කුමාරයා අතින් ශාක්‍යයෝ මරමුවට පත්විය.

## 09. දොළොස්වන වස් කාලයේ තුන් මසක් ''යව'' වළඳන්නට සිදුවීම.

බුදුරජාණන් වහන්සේ දොළොස්වන වස ගත කළේ වේරංජවෙහි ය. එහි දී වේරංජ බමුණා බුදුරජාණන් වහන්සේට වස්වැසිමට ආරාධනා කළ ද දානය දීමට අමතක විය. එම වස් තුන්මාසයක් මුළුල්ලෙහි බුදුරජාණන් වහන්සේ ඇතුලු භික්ෂු සංඝයා වළඳන ලද්දේ ''යව'' ආහාර පමණි. කොතරම් දායකයන් සිටිය ද ඒ වස් තුන්මාසයේ දී අශ්වයන්ට දෙන යව ආහාර වළඳන්නට සිදුවිය.

ඵුස්ස නම් බුදුරජාණන් වහන්සේ වැඩසිටි අවධියේ අප බෝධිසත්ත්වයන් වහන්සේ ද මිනිසෙක් වී උපත ලබා සිටියේය. උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේලා හැල් හාලේ දානය වළඳන දැක ''මේ අයට හැල්හාලේ බත් නොවෙයි, යවහාලේ බත් දෙන්න තමයි හොඳ'' යනුවෙන් නින්දා කළේය. ඒ විපාකය නිසා මෙසේ තුන් මාසයක් තිස්සේ යව හාලේ දානය වළඳන්නට සිදු වූ සේක.

## 10. නිතර නිතර කොන්දේ වේදනාවක් ඇතිවීම.

බුදුරජාණන් වහන්සේට නිතර නිතර හටගත් කොන්දේ අමාරුවක් ද විය. උන්වහන්සේට බොහෝ වෙලා හිදගෙන වැඩ සිටීමට අපහසු විය. බොහෝ අවස්ථාවල ධර්ම දේශනාවක් කෙටියෙන් විස්තර කොට ඉතිරිය සැරියුත් හිමියන්ට හෝ වෙනත් රහතන් වහන්සේ නමකට විස්තර කිරිමට දී උන්වහන්සේ විවේක ගත් ආකාරය පෙනේ.

බෝධිසත්ත්වයන් වහන්සේ එක් ආත්මභාවයක දී අඟුටුමිටි වාමන නමින් මල්ලව පොර තරඟකරුවෙකුව ඉපද සිටියේය. එම ආත්මභාවයේ දී එක් මල්ලව තරඟකරුවෙක් ඔසවා පොළොවේ ගැසීය. එහි දී එම මල්ලවපොර කරුගේ කොන්ද බිඳි දැමීමේ විපාක ලෙස බුදුරජාණන් වහන්සේටත් නිතර නිතර හටගත් සුව නොවන කොන්දේ කැක්කුමක් පැවති සේක.

## 11. ලෝහිත පක්ඛන්දිකා (ලේ අතීසාරය) රෝගය හටගැනිම.

චුන්දසූකර දුන් දානය වැළඳීමෙන් බුදුරජාණන් වහන්සේ රෝගාතුර වූහ. උන්වහන්සේට ලේ අතීසාරය (ලෝහිත පක්ඛන්දිකා) රෝගය වැළඳින. මේ නිසා උන්වහන්සේට බොහෝ වේදනාවක් හටගත්හ. උන්වහහන්සේ පිරිනිවන් පාන්නේ ද මෙම රෝගය උත්සන්න වීමෙනි.

අප බෝධිසත්ත්වයන් වහන්සේ එක් ආත්මභාවයක වෙද මහතෙකු වී උපත ලබා ක්‍රියා කළේය. එහි දී ධනවත් පුද්ගලයෙකු පැමිණ වෙදකම් ලබාගෙන නියමිත මුදල ගෙවීම ප්‍රමාද කළේය. ඒ නිසා ඔහුට විරේක බෙහෙතක් බොන්නට සැලැස්වීය. ඔහු එයින් ලේ විරේක වීම නිසා බිය වී මුදල් ගෙවා ඉක්මනින් බෙහෙත් ලබාගෙන සුවය ලබා ගත්තේය. එදා ධනලෝභය නිසා කළ කර්මයේ විපාක බුදු වූ ආත්මයේදීත් විඳිමට සිදු වූ සේක.

## 12. බුද්ධත්වය ලබාගැනිමට සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කිරීමට සිදුවීම.

සාරාසංඛෙයය කල්ප ලක්ෂයක් පාරමීතා ධර්ම සම්පූර්ණ කළ අප බෝධිසත්වයන් වහන්සේට බුද්ධත්වය ලබාගැනීම පිණිස අවුරුදු හයක් තිස්සේ දුෂ්කර ක්‍රියා කිරීමට ද සිදුවිය. බුද්ධත්වය අවබෝධ කිරීම පිණිස බොහෝ දුක්වින්දහ.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දවස අප බෝධිසත්ත්වයන් වහන්සේ ජෝතිපාල නමින් උපත ලබා සිටියේය. එම ආත්ම භාවයේ දී ඔහු මිසදිටුවෙකු විය. ඔහුගේ කුම්භකාර සටිකාර නම් සම්‍යක්දෘෂ්ටික මිතුරරෙක් සිටියේය.

ඔහු බුදුරජාණන් වහන්සේ බලන්න යමුයැයි යෝජනා කළේය. එහෙත් ජෝතිපාල තරුණයා මෙය ප්‍රතික්ෂේප කළේය. ප්‍රතික්ෂේප කලා පමණක් නොව ''මොන බුදුන් ද ඔය මුඩු මහණා'' දැකීමෙන් මට වැඩක් නැතැයි බුදුන්වහන්සේට අපහාස කළේය. කෙසේ හෝ සටීකාර තරුණයාගේ උනන්දුව නිසා ජෝතිපාල තරුණයා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ වෙත පසුව ගොස් ධර්මය ඇසීය. ඉන් පැහැදිමට පත් ඔහු බණ අසා පැහැදි පැවදි විය. එදා බුදුරජාණන් වහන්සේට කරන ලද අපහාසය නිසා බුද්ධත්වය අවබෝධ කර ගැනිමට නොහැකිව වසර හයක් දුෂ්කර ක්‍රියා කිරිමට සිදුවිය.

ඉහත සඳහන් කාරණා පිළිබඳ විමසා බැලිමේ දී අප බුදුරජාණන් වහන්සේ පෙරුම්පුරන කාලයේ දී සංසාරයේ නොයෙක් ආත්ම භාවයන්හි දී සිදු වූ අකුසල කර්ම හේතුවෙන් බොහෝ කල් අපායේ දුක්විඳි ආකාරය පෙන්නුම් කරයි. එසේම නොයෙක් ආත්මභාවයන් හි ඉපදී නොයෙක් දුක් කම්කටළු වලට මුහුණ දී ඇත. බුද්ධත්වය වැනි ශ්‍රේෂ්ඨ, උත්තම ජීවිතයක් ලැබුව ද එම අකුසල කර්ම වල විපාක විඳිමට සිදු වී ඇත. එසේ නම් අප ගැන කියනුම කවරේද? ඔබත් නිතරම යහපත් කර්ම කිරිමට උනන්දු වන්න. අකුසල කර්ම නොකිරිමට උත්සාහවත් වන්න.